**ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු පිළිබඳ විගණකාධිපති වාර්තාව -2010 වර්ෂය**

මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.

1.කොටස-අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු ගිණුම් පිළිබද සම්පිණ්ඩන වාර්තාව

2.කොටස-එක් එක් විසර්ජන ශිර්ෂයන්ට අදාළ විස්තරාත්මක වාර්තාව

**1 කොටස**

**ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ ගිණුම් පිලිබඳ සම්පිණ්ඩන වාර්තාව**

1. **අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු**

| වැය ශිර්ෂය | දෙපාර්තමේන්තුවේ නම |
| --- | --- |
| 236 | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව |

2. **වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ගිණුම් වර්ෂය ආරම්භයේදී පිළියෙල කර තිබුණ.

3. **ගිණුම්**

3.1 **විසර්ජන ගිණුම**

**(අ) ගිණුම් ඉදිරිපත් කිරීම**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවට අදාල විසර්ජන ගිණුම් 2011 මාර්තු 31 දින වන විට විගණනයට ඉදිරිපත් කර තිබුණි.

**(ආ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව සදහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.368,667,879 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.326,246,537 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදනයන්ගෙන් ශුද්ධ ඉතිරිවීම් රු. 20,744,515 ත් රු. 21,676,827 ත් අතර (පරාසයක එක් ප්‍රමාණයකින් හෙවත් ) මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 7 ත් 27 ක් ව පරාසයක පැවැතුණි. විස්තර පහත දැක්වේ.

| විසර්ජන ශීර්ෂය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ශුද්ධ ප්‍රතිපාදනය | | උපයෝජනය | | ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 134 | ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය | 159,431,000 | 129,776,879 | 154,568,783 | 113,894,581 | 4,862,217 | 15,882,298 |
| 236 | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව | 56,270,000 | 23,190,000 | 52,371,835 | 5,411,338 | 3,898,165 | 17,778,662 |
| | **එකතුව** | **215,701,000** | **152,966,879** | **206,940,618** | **119,305,919** | **8,760,382** | **33,660,960** |

### 3.2 අත්තිකාරම් ගිණුම්

#### 3.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**(අ) ගිණුම් ඉදිරිපත් කිරීම**

අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කළ යුතු රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම 2011 මාර්තු 31 දින වන විට විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුව සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කළ යුතු රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2011 ජූලි 01 දිනදීය.

**(ආ) සීමා පිලිපැදීම**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුව වෙත රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු සීමාවන් පිලිපැද තිබුණි.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | විෂය අංකය | උපරිම වියදම් සීමාව | තථ්‍ය | අවම ලැබීම සීමාව | තථ්‍ය | උපරිම හර ශේෂ සීමාව | තථ්‍ය |
|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය | 13401 | 11,000,000 | 7,378,799 | 3,400,000 | 4,192,277 | 50,000,000 | 21,913,808 |
| රාජ්‍යභාෂා දෙපාර්තමේන්තුව | 23601 | 10,000,000 | 3,432,212 | 3,200,000 | 3,457,075 | 30,000,000 | 15,906,604 |

### 3.3 අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම්

#### 3.3.1 අග්‍රිම ගිණුම්

අමාත්‍යාංශයේ 2010 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 1කට අඩු කාලපරිච්ඡේදයකට අයත් රු.16,390,920 ක්වූ හර ශේෂයක් තිබුණි.

#### 3.3.2 පොදු තැන්පත් ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේනතුවේ පොදු තැන්පත් ගිණුම්වල ශේෂවල එකතුව රු.2,307,514 ක් වූ අතර ඒ පිළිබඳ කාල විශ්ලේෂණයක් පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ශීර්ෂය | කාල විශ්ලේෂණය | | 2010 දෙසැම්බර් 31දිනට ශේෂය |
|---|---|---|---|---|
| | | වර්ෂ 1 ට වැඩි 2 ට අඩු | වර්ෂ 2 ට වැඩි 5 ට අඩු | |
| | | රු. | රු. | රු. |
| ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය | 134 | 2,252,414 | - | 2,252,414 |
| රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව | 236 | - | 55,100 | 55,100 |

## 11 කොටස

## එක් එක් විසර්ජන ශීර්ෂයන්ට අදාල විස්තරාත්මක වාර්තාව

### 1. විසර්ජන ශීර්ෂය 134 - ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය

ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2011 සැප්තැම්බර් 09 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුකම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

### 1.3 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණය

2010 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.7 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන නිරීක්ෂණ හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

#### (අ) ගිණුම් ඉදිරිපත් කිරීම

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 02 කට 2011 මාර්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු1,942,764 ක් විය.

**(ආ) අග්‍රිම ගිණුම**

මුදල් රෙගුලාසි 371 හි සදහන් විධිවිධානයන්ට පටහැනි ලෙස අවස්ථා 30 කදී එකතුව රු. 1,622,764 ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

**(ඇ) පොදු තැන්පත් ගිණුම**

එක්සත් ජාතීන්ගේ අරමුදල යටතේ ක්‍රියාත්මකවූ විදේශාධාර ව්‍යාපෘතියක රු.2,112,000 ක මුදලක් අදාල වර්ෂයේ ක්‍රියාකාර සැලැස්මට අනුකූලව වැය නොකර වසර 2 කට ආසන්න කාලයක් පොදුතැන්පත් ගිණුමේ රදවාගෙන තිබුණි.

**1.4 වත්කම් කළමනාකරණය**

අමාත්‍යාංශයේ වාහන පරිහරණය පරීක්ෂා කිරීමේදී අමාත්‍යාංශයට අයත් නොවන වාහන 14 ක් අතරින් වාහන 08 ක් වර්ෂය තුලදී පවරාගෙන තිබු අතර තවත් එවැනිම වාහන 06 ක් හිමිකාරත්වය පවරා ගැනීමකින් තොරව භාවිතයට ගෙන තිබුණි.

**1.5 අනුකූල නොවීම්**

**(අ) නීති,රීති,රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව. | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (i) | **මුදල් රෙගුලාසි** | | |
| | මුදල් රෙගුලාසි අංක 1646 | - | දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණකාධිපති වෙත යොමු කර නොතිබුණි. |
| (ii) | **චක්‍රලේඛ විධිවිධාන** | | |
| | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |
| | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය | - | අමාත්‍යාංශය සතු වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. |

| | |
|---|---|
| 1990 ඔක්තෝබර් 10 දිනැති අංක - 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 04 ඡේදය | ධාවනය කරන ලද ගමන් පළිබඳ මාසික සාරාංශ වාර්තා ලොග් සටහන් පොත් වල සටහන් කර නොතිබුණි. |

**භාණ්ඩාගාර චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| 2003 දෙසැම්බර් 31 දිනැති අංක 113 දරන අයවැය චක්‍රලේඛය | රු.320,000 | වාහන කුලියට ගැනීමේදී මාසික කුලිය රු. 40,000 නොඉක්මවිය යුතු අතර එසේ ඉක්මවන්නේ නම් මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවත් වාහන දෙකක් සඳහා එසේ අනුමැතියකින් තොරව ගෙවා තිබුණි. |

## 1.6 කාර්යසාධනය

2010 වාර්ෂික ක්‍රියාකාර සැලසුම්වලට අනුව අමාත්‍යාංශයේ හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවල ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### (අ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්

අමාත්‍යාංශය ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු නොකර තිබුණු අතර, එසේ නිරීක්ෂණය වු අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

i. ජාතික භාෂා අංශය විසින් පිළියෙල කරන ලද ක්‍රියාකාර සැලැස්මට අනුව සැලසුම් කරන ලද වැඩසටහන් 13 ක් අතුරින් වැඩසටහන් 04 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

ii. සමාජ ඒකාබද්ධතා අංශයේ ක්‍රියාකාර සැලැස්මට අනුව සැලසුම් කරන ලද ක්‍රියාකාරකම් 09 ක් අතුරින් 02 ක් සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කර නොතිබුණු අතර එක් ක්‍රියාකාරකමකින් කොටසක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

### (ආ) සැලසුම් කිරීම සහ කාර්යසාධනය

**වාර්ෂික ක්‍රියාකාර සැලැස්මට අනුකුල නොවීම**

පහත සඳහන් අවස්ථාවලදී ක්‍රියාකාර සැලැස්මට අනුකුලව ක්‍රියා නොකර තිබුණු බව නිරීක්ෂණය විය.

| | <u>සැලසුම් කරන ලද ක්‍රියාකාරකම්</u> | <u>අපේක්ෂිත ප්‍රගතිය</u> | <u>භෞතික ප්‍රගතිය</u> |
|---|---|---|---|
| (i) | ජාතික භාෂා ප්‍රතිපත්තියක් සකස් කිරීම. | අධ්‍යයන වාර්තාවක් සකස් කිරීම | අවසන් කර නොමැත |
| (ii) | භාෂා ප්‍රතිපත්තිය පිළිබඳව පොත් පිංචක් මුද්‍රණය කිරීම (ප්‍රතිපාදන රු. 300,000) | පොතක් මුද්‍රණය කිරීම | පොතක් ලෙස මුද්‍රණය නොකර ඩුප්ලෝ ක්‍රමයට අත් පත්‍රිකාවක් මුද්‍රණය කර ඇත. |
| (iii) | රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධව වූ තොරතුරු බෙදාහැරීම | රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය හා සම්බන්ධ තොරතුරු පත්‍රිකාවක් පිළියෙල කර නිකුත් කිරීම. | පිළියෙල කර නිකුත් කර නොමැත. |
| | | සණස , සමෘද්ධි, ගැමි දිරිය යන ව්‍යාපෘති හරහා තොරතුරු සන්නිවේදනය. | ක්‍රියාත්මක කර නොමැති අතර 2011 වර්ෂයේදී වැඩමුළු 04 ක් පැවැත්වීමට සැලසුම් කොට ඇත. |
| | | විද්‍යුත් තැපැල හරහා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබඳව පෞද්ගලික අංශය දැනුවත් කිරීම. | විද්‍යුත් තැපැල හරහා යැවීමට පතිකාවක් සැලසුම් කරන අතර කාර්යයන් අවසන් කොට නොමැත. |
| (iv) | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, රාජ්‍ය භාෂා කොමිෂන් සභාව හා ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීම | අදාල ආයතන වලින් තොරතුරු එක්රැස් කිරීම.<br>වාර්තාවක් පිළියෙල කිරීම | තොරතුරු ලබාගෙන ඇතත් වාර්තාවක් පිළයෙල කර නැත. |
| (v) | භාෂා ප්‍රතිපත්තිය ආයතනික මට්ටමින් ක්‍රියාත්මක කිරීමට අදාල දළ සැලැස්මක් සකස් කිරීම. | නිශ්චිත ඉලක්කයන් දක්වා නොතිබුණි. | අවසන් කර නොමැත. |
| (vi) | දෙමළ භාෂා ප්‍රවීණතාව සහිත පළපුරුදු නිලධාරි සංචිතයක් ඇති කිරීම | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, රාජ්‍ය භාෂා කොමිෂන් සභාව යන ආයතන සමග සාකච්ජා පැවැත්වීම | කාර්යයන් අවසන් කර නොමැත |

| | | |
|---|---|---|
| (vii) සණස, ගැමිදිරිය, සමෘද්ධි යන සමිති හරහා භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම දිරිමත් කිරීමට අදාල වැඩසටහන් දියත් කිරීම. | නිශ්චිත ඉලක්කයන් දක්වා නොතිබුණි. | මෙය ක්‍රියාවට නගා නොතිබුණු අතර 2011 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. |

## 1.7 මානව සම්පත් කළමනාකරණය

### අනුමත සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු

2010 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 13 | 11 | 02 |
| (ii) තෘතියික මට්ටම | 04 | 02 | 02 |
| (iii) ද්විතියක මට්ටම | 67 | 40 | 27 |
| (iv) ප්‍රාථමික මට්ටම | 185 | 169 | 16 |
| එකතුව | 269 | 222 | 47 |

## 2. විසර්ජන ශීර්ෂය 236 - රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2011 සැප්තැම්බර් 26 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ගණන් දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

## 2.3 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණය

2010 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.8 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන නිරීක්ෂණ හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) ගිණුම් ඉදිරිපත් කිරීම

(i) රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් 2011 මාර්තු 31 දින වන විට පහත සඳහන් ගිණුම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විෂය අංකය | ගිණුමේ නම |
|---|---|
| 23601 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශනය |

**(ආ) අයවැය විචලනය**

පුනරාවර්තන හා මූලධන වැය විෂයයන් 04 ක් යටතේ ප්‍රතිපාදනය කර තිබුණු එකතුව රු.17,640,000 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

(i) 1994 අගෝස්තු 10 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 90 ප්‍රකාරව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් කටයුතු සම්බන්ධයෙන් ඉදිරිපත් කරන වාර්ෂික සැසඳුම් ප්‍රකාශයෙහි දෙපාර්තමේන්තු පොත් සහ භාණ්ඩාගාර පොත්වල දැක්වෙන හර / බැර ශේෂ අතර වෙනසක් වේනම් එම වෙනසට හේතු දක්වා සැසඳුම් ප්‍රකාශය ඉදිරිපත් කළ යුතු වුවත්, 2010 වර්ෂයේදී දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂයන් භාණ්ඩාගාරයේ පොත් අනුව රු 98,716 කින් නොසැසඳෙන බව නිරීක්ෂණය විය.

(ii) චක්‍රලේඛයේ ආකෘති අංක II ප්‍රකාරව ලැබීමට ඇති ණය අත්තිකාරම් ශේෂ පිළිබඳව කාල විශ්ලේෂණයක් සකස් කල යුතු වුවත්, එසේ සකස් කර නොතිබුණි.

(iii) ආයතන සංග්‍රහයෙහි XXIV හි 4.2.3 ජේදය ඉදිරිපත් කළ යුතු විශ්‍රාම ගන්නා අවස්ථාවේ ආපසු ගෙවිය යුතු ණය ශේෂයන් පරිවර්තිත විශ්‍රාම වැටුපෙන් අයකර ගැනීමට හැකිවන පරිදි පොරොන්දුවකට අත්සන් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුවේ ණය ලබාගත් කිසිදු නිලධාරියකු එසේ අත්සන් කර නොතිබුණි.

## 2.4 වත්කම් කළමනාකරණය

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

වර්ෂයට අදාල සමීකෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත හා ඌනතා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 757 (2) පරිදි කටයුතු කර නොතිබුණි.

## 2.5 අනුකූල නොවීම්

(අ) **නීති,රීති,රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව. | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (i) **මුදල් රෙගුලාසි** | | |
| මුදල් රෙගුලාසි 371 (අ) හා 446(3) | - | රු. 7,500 කට යටත්ව සුළු මුදල් අග්‍රිමයක් තබාගැනීම හා සුළු මුදල් අග්‍රිමය වෙනුවෙන් පමණක් ලැබුණු මුදල් හා ගෙවීම් සුළු මුදල් පොතක ඇතුළත් කළ යුතුය. දෙපාර්තමේන්තුව විසින් වෙනම සුළු මුදල් අග්‍රිමයක් පවත්වා නොගන්නා අතර සරප් නිලධාරිණිය විසින් ලබාගන්නා අත්තිකාරම් මුදලින් සුළු මුදල් ගෙවීම් කර තිබුණි. |
| මු.රෙ. 260 (1) | - | මුදල් ලබාගැනීමට ආදායකයා පැමිණි කළ ඔහුගේ අනන්‍යතාවය සැකහැර දැන ගැනීම සඳහා ජාතික හැඳුනුම්පත පරීක්ෂා කර හැඳුනුම්පත් අංකය ගෙවීම් වවුචරයේ සඳහන් කළ යුතු වුවත් දෙපාර්තමේන්තුවේ කිසිදු වවුචරයක එසේ සඳහන් කර නොතිබුණි. |
| මුදල් රෙගුලාසි 231(1) | රු. 1,326,222 | හැකිතාක් දුරට වෙනත් ලේඛනයක් නොබලා හර වැරදි බැලීමට හැකිවනු පිණිස සෑම සේවයක් පිළිබඳවම සම්පූර්ණ විස්තර සියළුම වවුචරවල අඩංගු විය යුතුය. නමුත් වවුචර් 08 ක ලිපිගොනු අංකය හෝ අදාල ලිපි තොරතුරු වවුචරය සමග හෝ නොතිබුණි. |
| මුදල් රෙගුලාසි 104 (4) | - | ආයතනයේ ඩබල් කැබ් රථය 2009 පෙබරවාරි 04 අනතුරට ලක්වීම සම්බන්ධයෙන් වූ පූර්ණ වාර්තාව 2010 නොවැම්බර් 10 දින දක්වාම ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| මුදල් රෙගුලාසි 785(4) | - | ආයතනයේ සියලුම වාහන සම්බන්ධයෙන් කරන ලද අළුත්වැඩියාවන්ට අදාල සියලුම තොරතුරු ඇතුළත් කොට ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 751 | - | රජයේ ආයතන වලට ලැබෙන සියලුම භාණ්ඩ වාහාම බඩු ලේඛණ පොතෙහි සටහන් කළ යුතු වුවත් , දෙපාර්තමේන්තුවේ වාහන සඳහා මිලදී ගන්නා ටයර් බඩු වට්ටෝරු පොතෙහි සටහන් කර නොතිබුණි. |

**(ii) චක්‍රලේඛ විධිවිධාන**

**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| 2008 ජුනි 26 දිනැති චක්‍රලේඛ 13/2008 හා 14/2008 | රු. 35,568 | (i) මාසක ඉන්ධන දීමනාව හා මාසික ප්‍රවාහන දීමනාව ලබාගන්නා නිලධාරියකු අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියකින් තොරව සේවා ස්ථානයෙන් බැහැර රාජකාරි සඳහා පෞද්ගලික කුලී රථ භාවිතා කර තිබිණි. |
| | - | (ii) තනතුරු එකකට වැඩි සංඛ්‍යාවක රාජකාර ඉටු කරන අවස්ථාවක අතිරේක තනතුර සඳහා කරන සේවා වෙනුවෙන් ඉන්ධන ප්‍රතිපාදන සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ පෞද්ගලික අනුමැතිය ලබා ගත යුතු වුවත් රාජ්‍ය භාෂා කොමසාරිවරයා රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ ලේකම්වරයා වශයෙන් කටයුතු කරමින් අවස්ථා 17 කදි කොමිෂන් සභාව සතු වාහනය යොදා ගෙන තිබුණි. |

**වෙනත් චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ උපදේශක චක්‍රලේඛයේ 02 හා 3.1 වන වගන්ති | - | සෑම පුස්තකාලයකටම උපදේශක කමිටුවක් පිහිටුවා නැතිවු පුස්තකාල ද්‍රව්‍ය සම්බන්ධයෙන් කටයුතු කිරීම හා භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කල යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. |

**(ආ) බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම**

2007 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ සංශෝධිත 26 (අ) වගන්තිය ප්‍රකාරව 2007 ජනවාර 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රජයේ නියෝජිතායතනයක් විසින් යම් සේවාසපයන්නකු හට ගෙවන එකතු කළ අගය මත බද්දෙන් 33 1/3% රඳවාගෙන දේශීය ආදායම් ජනරාල් වෙත ඊලඟ මස පළමුවන සතිය තුළදී ප්‍රේෂණය කළ යුතුය.එසේ වුවත් අවස්ථා 11 කදී දෙපාර්තමේන්තුව පවිත්‍රතා හා ආරක්ෂක කටයුතු සඳහා ගෙවන ලද සේවා ගාස්තු වලින් රු. 22,802 ක මුදලක් රඳවාගෙන දේශීය ආදායම් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

## 2.6 කාර්යසාධනය

2010 වාර්ෂික ක්‍රියාකාර සැලසුම්වලට අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) වාර්ෂික ක්‍රියාකාර සැලැස්මට අනුකූල නොවීම**

පහත සඳහන් අවස්ථාවලදී ක්‍රියාකාර සැලැස්මට අනුකූලව ක්‍රියා නොකර තිබුණු බව නිරීක්ෂණය විය.

i. 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2.4.2 ප්‍රකාරව පාර්ලිමේන්තුව වෙත සභාගත කළයුතු කාර්යය සාධන වාර්තාවට අනුකූල වන පරිදි ක්‍රියාකාර සැලැස්ම සකස් කළයුතුය. එසේ වුවද විෂයයට අදාළ වැඩසටහන් ආරම්භ කරන දිනය පමණක් සඳහන් කර ඇති අතර ඒවා නිම කිරීමට අපේක්ෂිත කාලය හෝ කාර්තුමය වශයෙන් බෙදා වෙන්කර නොතිබුණි.

ii. දීප ව්‍යාප්ත පංති පැවැත්වීම සඳහා සිංහල, දෙමළ , ඉංග්‍රීසි මට්ටම් II හා III වෙනුවෙන් සැලසුම් කළ පංති සංඛ්‍යාව 147 ක් වුවත් ආරම්භ කර තිබුණේ පංති 46 ක් පමණි. ඊට අමතරව II මට්ටමේ භාෂා පුහුණු පංති 05 ක් සැලසුම් කර තිබුණද එම පංති ආරම්භකර නොතිබුණි. 2010 වර්ෂයේ සිට භාෂා පුහුණු පංති අගලවත්ත භාෂා පුහුණු ආයතනය මගින් පැවැත්වීමට තිරණය කර ඇති නිසා දෙපාර්තමේන්තුව මගින් භාෂා පුහුණු පංති නොපැවත්විය යුතු බවට අමාත්‍යාංශයෙන් උපදෙස් ලැබී ඇති බව දක්වා තිබුණි. එනමුත් එය සනාථ කිරීම සඳහා ලිඛිත සාක්ෂි කිසිවක් විගණනයට ලබාගත නොහැකි විය.

**(ආ) අවිධිමත් ගනුදෙනු**

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථාවක් පහත දැක්වේ.

2002 වර්ෂයේ දී ආරම්භ කරන ලද ත්‍රි භාෂා ශබ්ද කෝෂයේ 11 කොටසේ සම්පාදන කටයුතු සඳහා මේ වන විට ගතවී ඇති කාලය වසර 8 ක් වන අතර මුද්‍රණ වියදම් හැර 2010 දෙසැම්බර් 31 දින වනවිට දරා ඇති මුළු පිරිවැය රු. 4,260,988 ක් වේ.මෙපමණ වියදමක් හා කාලයක් ගතවී තිබියදී දෙපාර්තමේන්තුව ශබ්ද කෝෂයේ සම්පාදන කටයුතු අවසන් කිරීමට අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය විය.

## 2.7 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

දෙපාර්තමේන්තුව විසින් කර ඇති සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණ වලදී එසේ අනාවරණය වූ ගනුදෙනුවක් පිළිබඳ විස්තර පහත දැක්වේ.
රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ දිනක ගෙවිය යුතු වවුචර් පත්වල වටිනාකමට අදාලව මුදල් ලබාගෙන ගෙවීම්කිරීමට කටයුතු නොකරන අතර දින ගණනාවකට ප්‍රමාණවත් අත්තිකාරමක් ලබාගෙන මුදල් ගෙවීම් කරනු දක්නට ලැබුණි. මෙසේ ලබාදෙන අත්තිකාරම් මුදලින් මාසයක් වැනි දිගු කලක් වියදම් දරන අතර එම කාල පරිච්ඡේදය මුළුල්ලේම සරප් නිලධාරිනිය අත මුදල් රැඳී පවතින බව නිරීක්ෂණය වේ.

## 2.8 මානව සම්පත් කළමනාකරණය

### අනුමත සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු

2010 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 09 | 03 | 06 |
| (ii) | ද්විතියක මට්ටම | 151 | 138 | 13 |
| (iii) | ප්‍රාථමික මට්ටම | 12 | 10 | 02 |
| | එකතුව | 172 | 151 | 21 |

පහත සඳහන් කරුණ ද නිරීක්ෂණය විය.
තනතුර සඳහා අදාළ සුදුසුකම් හා වැටුප් පරිමාණයන් අතර පැවති විචලතාවය හේතුවෙන් භාෂා විද්‍යාගාර අධිකාරී තනතුර ස්ථාපනය කළ දිනයේ සිට මේ දක්වා වසර 9 කට අධික කාලයක් තනතුර පුරප්පාඩුව පවතින අතර මෙම කාලය අතර තුරදී දෙවරක් ගැසට් නිවේදන නිකුත් කර තිබුණි.